අ.පොෂ. (සා.පෙළ) විභාගය - උපකාරක තක්සේරුව - 2026

අධ්‍යාපන අමාත්‍යාංශය - කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව

කෘෂි හා ආහාර තාක්ෂණය	81	S	I, II	පැය තුනයි

කෘෂි හා ආහාර තාක්ෂණය I කොටස

උපදෙස් :

1. **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
2. 1 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට (1) (2) (3) (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, **එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**
3. උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
4. උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.

01. කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා අතීත රජවරුන් විසින් නිර්මිත වැව් හා සම්බන්ධ තොරතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරන්න.
   1. වසභ රජතුමා - මින්නේරිය වැව
   2. ධාතුසේන රජතුමා - කලා වැව
   3. මහා පරාක්‍රමබාහු රජතුමා - අභය වැව
   4. අග්බෝ රජතුමා - තිසා වැව

02. කාලගුණික පරාමිති මැනීම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
   A. සුළඟේ වේගය මනිනු ලබන්නේ පැයට කිලෝමීටර් (kmh^{-1}) වලිනි.
   B. ආලෝක තීව්‍රතාව මනිනු ලබන ඒකකය ලක්ස් (Lux) ය.
   C. වායුගෝලයේ උෂ්ණත්වය මැනීමට බහුලව යොදාගැනෙනුයේ, තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය ය.
   ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය /ප්‍රකාශ වන්නේ,

   1. A හා B පමණි.
   2. A හා C පමණි.
   3. B හා C පමණි.
   4. A, B හා C යන සියල්ලම ය.

03. ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප වර්ගීකරණයට පදනම් වූ මූලික සාධක වන්නේ,
   1. භූ විෂමතාව, පස් වර්ගය හා භූමි භාවිතය යි.
   2. වාර්ෂික වර්ෂාපතනය, උච්චත්වය හා භූ විෂමතාව යි.
   3. භූ විෂමතාව, පස් වර්ගය හා උච්චත්වය යි.
   4. වාර්ෂික වර්ෂාපතනය, පස් වර්ගය හා උච්චත්වය යි.

04. තාවකාලික මැලවීමට ලක් වූ ශාකයක් සහිත බඳුනකට ජලය යොදන විටදී බඳුනේ පහළින් ජලය ස්වල්පයක් වැස්සී ඉවත් විය. එසේ ඉවත්වූයේ,
   1. ජලාකර්ෂක ජලය යි.
   2. ගුරුත්වාකර්ෂණ ජලය යි.
   3. කේශාකර්ෂණ ජලය යි.
   4. කේශාකර්ෂණ හා ගුරුත්වාකර්ෂණ ජලය යි.

(දෙවැනි පිටුව බලන්න)

Past Papers Wiki

05. බෝග වගාවට වඩාත් සුදුසු ලෙස ජලය හා වාතය රඳවා ගැනීමේ හැකියාව හා මනා ජලවහනයකින් යුතු පාංශු ව්‍යූහ ආකාරය වන්නේ,
    1. කණිකාමය ව්‍යූහයයි.
    2. අණු කෝණාකාර ව්‍යූහයයි.
    3. ස්ථම්භික ව්‍යූහයයි.
    4. කැටිති ව්‍යූහයයි.

06. දුර්වල ජලවහනය සහිත පසක, පාංශු වර්ණය අලු දුඹුරු පැහැ වීමට හේතු වන ප්‍රධාන ඛනිජ අයනය වන්නේ,
    1. ෆෙරස් අයන (Fe^{2+}) ය.
    2. ෆෙරික් අයන(Fe^{3+}) ය.
    3. සෝඩියම් අයන(Na^{+}) ය.
    4. කැල්සියම් අයන (Ca^{2+}) ය.

07. ඇලි ඛාදනයට ලක් වූ භූමියක් තව දුරටත් ඛාදනය වීමේ ප්‍රතිඵලය වන්නේ එම භූමිය,
    1. විසිරි ඛාදනයට ලක් වීම ය.
    2. ස්ථරීය ඛාදනයට ලක් වීම ය.
    3. ඇගිලි ඛාදනයට ලක් වීම ය.
    4. දිය පහර ඛාදනයට ලක් වීම ය.

08. මැල්වේසියේ කුලයට අයත් බෝග වර්ග පමණක් අඩංගු වරණය තෝරන්න.
    1. අඹ, කජු, ජම්බු
    2. කංකුන්, බතල, නිවිති
    3. බටු, තක්කාලි, අර්තාපල්
    4. කජු, බණ්ඩක්කා, වද

09. ද්විතීයික බිම් සැකසීමේ උපකරණ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    1. තල පෝරුව, උදැල්ල, ජපන් රොටරි වීඩරය
    2. උදැල්ල, තැටි නඟුල, ජපන් පරිවර්ත්‍ය නඟුල
    3. භ්‍රමණ පෝරුව, ඇණ දත් පෝරුව, තල පෝරුව
    4. තල පෝරුව, උදළු මුල්ලුව, පා මුල්ලුව

10. නොරිදෝකෝ තවානේ පතුළට සිහින් වැලි තට්ටුවක් හෝ අඩක් පිළිස්සූ දහයියා ස්ථරයක් යොදාගැනීමේ අරමුණ වන්නේ,
    1. අතිරික්ත ජලය ඉවත් කිරීම ය.
    2. බීජ ප්‍රරෝහණය ඉක්මන් කිරීම ය.
    3. තවාන් කුට්ටි පහසුවෙන් ඉවත්කර ගැනීම ය.
    4. දිලීර රෝග වලින් තවාන ආරක්ෂා කරගැනීම ය.

11. ජල සම්පාදන ක්‍රම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
    A. පාංශු ඛාදනය අවම වේ.
    B. බෝග වල පුෂ්ප පරාගණයට බාධා සිදු නොවේ.
    C. ජලය සමඟ පොහොර ද යෙදිය හැකි වේ.
    D. අධික සුළං තත්ත්ව වලදී ද යොදා ගත හැකි වේ.

    මෙම ප්‍රකාශ අතුරෙන් ඉසින ජල සම්පාදනය පිළිබඳ සත්‍ය වන්නේ,
    1. A හා B ය.
    2. A හා C ය.
    3. B හා C ය.
    4. B හා D ය.

(තුන්වැනි පිටුව බලන්න)

12. බෝග වගා භූමියක දුර්වල ජලවහන තත්වයක් පැවතීම හේතුවෙන්,
    1. හිතකර පාංශු ක්ෂුද්‍ර ජීවීන්ගේ ගහනය වැඩිවේ.
    2. බීජ ප්‍රරෝහණයට හා මූල පද්ධතියේ වර්ධනයට බාධා ඇති වේ.
    3. ශාක වලට නියං කාලයට ඔරොත්තු දීමට ඇති හැකියාව වැඩි කරයි.
    4. භූමියේ කාබනික ද්‍රව්‍ය වියෝජනය හොඳින් සිදුවන නිසා පස කළු පැහැවේ.

13. වී වගාවේ මතුපිට පොහොර ලෙස යොදා ගැනෙන TDM මිශ්‍රණයේ අඩංගු වන ප්‍රධාන ශාක පෝෂක වන්නේ,
    1. නයිට්‍රජන් (N) හා පොටෑසියම් (K) ය.
    2. නයිට්‍රජන් (N) හා පොස්පරස් (P) ය.
    3. පොස්පරස් (P) හා පොටෑසියම් (K) ය.
    4. නයිට්‍රජන් (N),පොස්පරස් (P), පොටෑසියම් (K) යන සියල්ලමය.


14. කොළ පොහොර සඳහා යොදා ගන්නා රනිල බෝග පමණක් ඇතුළත් වරණය තෝරන්න.
    1. සැල්වීනියා, ග්ලිරිසීඩියා
    2. එරබදු, සැල්වීනියා
    3. අඩනහිරියා, වල් සූරියකාන්ත
    4. ග්ලිරිසීඩියා, අඩනහිරියා


15. ජල සම්පාදන මාර්ග අවහිර කරනු ලබන ආක්‍රමණික වල් පැළෑටියකි,
    1. තුනැස්ස.
    2. සැල්වීනියා.
    3. විඩෙලියා.
    4. පාතීනියම්.

16. ශාකවල මූල පද්ධතියේ සනාල පටක ආසාදනය කරමින් සොලනේසියේ හා කුකර්බිටේසියේ කුලයේ බෝගවලට වැළඳෙන බැක්ටීරියා රෝගයකි,
    1. දියමලන් කෑම.
    2. වඳ පීදීම.
    3. මුල් ගැට රෝගය.
    4. හිටු මැරීම.

17. කෘමි නොවන සත්ත්ව පළිබෝධ අතුරින්, පියවි ඇසින් නිරීක්ෂණයට අපහසු සන්ධිපාදක ජීවියෙකි,
    1. කිඩෑවා.
    2. මයිටාවා.
    3. පිටි මකුණා.
    4. කූඩිත්තා.

18. පහත A හා B ලෙස දැක්වෙන්නේ කෘමි ජීවන චක්‍රවල පවතින රූපාන්තරණ ආකාර දෙකකි.






ඉහත A හා B ලෙස දැක්වෙන රූපාන්තරණ ආකාර පෙන්නුම් කරන පළිබෝධ සඳහා වන නිවැරදි උදාහරණ දැක්වෙන පිළිතුර තෝරන්න.

	A	B
1	ඉල් මැස්සා	අවුලකපෝරා කුරුමිණියා
2	පැළ මැක්කා	රයිනෝසිරස් කුරුමිණියා
3	සුදු මැස්සා	පැළ මැක්කා
4	ඉල් මැස්සා	කූඩිත්තා

19. වී වගාවේ දී පැරෂුට් ක්‍රමය මඟින් පැළ වැපිරීම සඳහා සකස් කරනු ලබන තවාන් වර්ගය කුමක්ද?
    1. ඩැපොග් තවාන
    2. මඩ තවාන
    3. තැටි තවාන
    4. නොරිදෝකෝ තවාන

20. වී වගාවේ බහුලව දක්නට ලැබෙන තෘණ වර්ගයට අයත් වල් පැළෑටි පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    1. දිය හබරල, ඇටවරා
    2. තුනැස්ස, ජපන් ජබර
    3. තුන්හිරියා, කුඩමැට්ට
    4. බටදැල්ල, මාරුක්

21. පහත දක්වා ඇත්තේ ඒකබීජපත්‍රී බීජයක දික්කඩක රූප සටහනකි. A,B හා C කොටස් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.



	A	B	C
1	භ්‍රෑණපෝෂය	බීජ මූලය	බීජාංකුරය
2	බීජ පත්‍රය	බීජාංකුරය	බීජාවරණය
3	භ්‍රෑණපෝෂය	බීජ පත්‍රය	බීජාවරණය
4	බීජෝපරිය	බීජාධරය	බීජාවරණය

22. ස්වාභාවික වර්ධක ප්‍රවාරණ ව්‍යූහයක් වන රයිසෝම මගින් පමණක් පැළ ලබා ගත හැකි ශාක දැක්වෙන පිළිතුර තෝරන්න.
    1. ගොටුකොළ, ස්ට්‍රෝබෙරි, කෙසෙල්
    2. කහ, ඉඟුරු, බුත්සරණ
    3. අර්තාපල්, ඉන්නල, බතල
    4. කිරිඅල, රතුළූණු, අර්තාපල්

23. දැනට ශ්‍රී ලංකාවේ පටක රෝපණය බහුලව සිදුකරන ශාක ඇතුළත් පිළිතුර තෝරන්න.
    1. දූරියන්, පේර, බෙලි
    2. දොඩම්, රඹුටන්, ඇන්තූරියම්
    3. අර්තාපල්, සැපදිල්ලා, පොල්
    4. අන්නාසි, ඕකිඩ්, කෙසෙල්

24. බීජ සුප්තතාව ඉවත් කිරීමට අනුගමනය කරන ක්‍රියාවක් **නොවන්නේ**,
    1. ඉතා කුඩා බීජ රෝපණයේදී වැලි සමඟ මිශ්‍ර කිරීම ය.
    2. ඝන බීජාවරණය ඉවත් කිරීම ය.
    3. බීජ ජලයේ පෙඟවීම ය.
    4. බීජාවරණය වැලි කඩදාසියකින් පිරිමැදීම ය.

25. ඝන මාධ්‍ය තුළ කෙරෙන නිර්පාංශු වගාව සඳහා සුදුසු බෝග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    1. අන්නාසි, අර්තාපල්
    2. තක්කාලි, බෙල් පෙපර්
    3. බීට්රූට්, රාබු
    4. මාලු මිරිස්, කැරට්

26. පාලිත තත්ත්ව යටතේ බෝග වගාවේ දී පොලිතීන් ගෘහයක් තුළ, රත්වන වාතය සංවහන ධාරා ලෙස ඉවත්ව යාමට යොදාගත හැකි ක්‍රියාමාර්ගයක් වන්නේ,
    1. පැති බිත්ති දැල් වලින් ආවරණය කිරීම ය.
    2. මුදුන් වා කවුළු යෙදීම ය.
    3. වායු සමනය කිරීම ය.
    4. මිහිදුම් උත්පාදක යෙදීම ය.

27 . හේන් ගොවිතැනේ දී බීජ සිටුවීම සිදුකරන කාලසීමාව වන්නේ,
    1. ජූලි සිට අගෝස්තු දක්වා ය.
    2. අගෝස්තු සිට සැප්තැම්බර් මැද දක්වා ය.
    3. ජුනි සිට ජූලි දක්වා ය.
    4. සැප්තැම්බර් අග සිට නොවැම්බර් මැද දක්වා ය.

(පස්වැනි පිටුව බලන්න)

28. ශාකවලට ප්‍රමාණවත් ලෙස ආලෝකය **නොලැබීම** නිසා,
1. තක්කාලි ගෙඩි පැලීම සිදුවේ.
2. වර්ධනය වන ශාකවල කඳේ පර්ව කෙටිවේ.
3. විලාඩ් අඹ ඇඹුල් රසයකින් යුතුවේ.
4. වැල්දොඩම්වල කුඩා ඵල හැකිලී බිම පතිතවේ.

29. විටමින් වර්ග ඌන වූ විට ඇතිවන තත්ත්ව පිළිබඳ පහත දී ඇති තොරතුරු සලකා බලන්න.
A) විටමින් A - ඇසේ බිටෝ ලප ඇති වීම
B) විටමින් K - තුවාල වූ විටක දී රුධිරය කැටි ගැසීම ප්‍රමාද වීම
C) විටමින් C - දත් හා අස්ථි දිරා යාම
D) විටමින් D - ඔස්ටියෝපොරෝසිස්
ඉහත තොරතුරු අතරින් නිවැරදි වනුයේ,

1. A, B හා C ය. 2. A, B හා D ය.
3. A, C හා D ය. 4. B, C හා D ය.

30. සැකසූ ආහාර දැවටීම සඳහා ඇසුරුම් ද්‍රව්‍යයක් වන මුද්‍රිත පුවත්පත් භාවිතය නිර්දේශ නොකිරීමට ප්‍රධාන හේතුව වන්නේ,
1. මුද්‍රණ තීන්ත වල ඇති ඊයම් ශරීරගත විය හැකි නිසා ය.
2. සිත් ඇදගන්නා සුළු දැවටුමක් නොවන නිසා ය.
3. ආහාර කල් තබා ගැනීම සඳහා නුසුදුසු වීම නිසා ය.
4. මුද්‍රිත තීන්ත තැවරී ආහාර අප්‍රියජනක වන නිසා ය.

31. කිරි පැස්වරීකරණය කිරීමේ HTST ක්‍රමය ලෙස දැක්වෙන්නේ,
1. අඩු උෂ්ණත්ව - දිගු කාල ක්‍රමය යි.
2. වැඩි උෂ්ණත්ව - කෙටි කාල ක්‍රමය යි.
3. අඩු උෂ්ණත්ව - කෙටි කාල ක්‍රමය යි.
4. වැඩි උෂ්ණත්ව - දිගු කාල ක්‍රමය යි.

32. නිර්දේශිත පරිරක්ෂක ද්‍රව්‍ය භාවිත කිරීමෙන් සිදුවන කාර්ය කිහිපයක් පහත දැක්වේ.
A. ආහාරයේ ඇති ජල ප්‍රමාණය අඩු කිරීම
B. ආහාරයේ රසය වැඩි කිරීම
C. ආහාර මත අහිතකර බැක්ටීරියා වර්ධනය පාලනය කිරීම
D. මස් වල ආවේණික රෝස පැහැය පවත්වා ගැනීම

ඉහත දැක්වෙන කාර්ය අතරින් සෝඩියම් නයිට්‍රයිට් භාවිතයෙන් සිදුවන්නේ,
1. A හා B ය. 2. A හා C ය. 3. A හා D ය. 4. C හා D ය.

33. ආහාර පරිරක්ෂණය කිරීම සිදුකරන ක්‍රම කිහිපයක් පහත දැක්වේ.
A - වියළීම B - අධිශීතනය C - පැසවීම D - දුම්ගැසීම E - ශීතනය
ඉහත ක්‍රම අතරින් මාළු පරිරක්ෂණය සඳහා යොදාගත හැකි ක්‍රම වන්නේ,
1. A, B හා D ය.
2. A, B හා E ය.
3. A, C හා D ය.
4. B, D හා C ය.

(හයවැනි පිටුව බලන්න)

Past Papers Wiki

34. කිරි ලබා ගැනීම සඳහා ඇති කරනු ලබන ගව වර්ගයක් පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දක්වා ඇත.

- නෙදර්ලන්තයෙන් සම්භවය ලබා ඇති අතර ශ්‍රී ලංකාවේ උඩරට තෙත් කලාපයේ ඇති කිරීමට නිර්දේශිතය.
- එක් මුරයකදී කිරි ලීටර් 6 000-7 000 අතර ප්‍රමාණයක් නිෂ්පාදනය කරයි.
- කිරි වල මේද ප්‍රතිශතය 3.5 - 4.0ත් අතර වෙයි.

ඉහත ප්‍රකාශ වලින් විස්තර වන ගව වර්ගය වන්නේ,

1. ජර්සි ය. 2. අයර්ෂයර් ය. 3. ප්‍රීෂියන් ය. 4. සහිවාල් ය.

35. පහත වගුවේ දැක්වෙන තොරතුරු අතරින් ගවයින්ට වැළඳෙන රෝගය හා රෝග කාරකය නිවැරදිව සඳහන් වන වරණය තෝරන්න.

	රෝගය	රෝග කාරකය
1.	බුරුළු ප්‍රදාහය	බැක්ටීරියා
2.	කාලගාත්‍රා රෝගය	වෛරස්
3.	කුර හා මුඛ රෝගය	බැක්ටීරියා
4.	රක්තාශ්‍ර රෝගය	වෛරස්

36. බිත්තර සඳහා කිකිළියන් ඇති කිරීමේදී බaaඩරයක් තුළ පැටවුන් ඇති කිරීමේ කාලසීමාව වන්නේ,

1. දින 1-10 දක්වා ය. 2. දින 1-12 දක්වා ය.
3. දින 1-14 දක්වා ය. 4. දින 1-21 දක්වා ය.

37 හා 38 ප්‍රශ්න සඳහා පිළිතුරු දීමට පහත තොරතුරු උපකාර කර ගන්න.

බිත්තර සඳහා කිකිළියන් ඇතිකරන ගොවිපොළක පහත රෝග ලක්ෂණ සහිත සතුන් දැක ගැනීමට හැකි විය.

- එකට ගුලි වී සිටීම
- සුදු පැහැයට මලපහ පිට වී ගුද මාර්ගය අවට පිහාටු සුදු පැහැ මල සමග තෙත් වී ඇලී තිබීම
- සති 2-5ත් වයස සතුන් විශාල වශයෙන් එකවර මිය යාම

37. ඉහත රෝග ලක්ෂණ අනුව එම ගොවිපොළේ කුකුළන්ට වැළඳී ඇති රෝගය විය හැක්කේ,

1. රැනිකට් ය. 2. කොක්සිඩියෝසිස් ය.
3. පණු රෝගය ය. 4. පුල්ලෝරම් ය.

38. ඉහත රෝග ලක්ෂණ පෙන්නුම් කරන රෝගයේ රෝග කාරකයා වන්නේ,

1. වෛරසයකි. 2. ප්‍රොටොසෝවාවෙකි.
3. බැක්ටීරියාවකි. 4. වටපණුවෙකි.

39. ආහාර ඇසුරුම්කරණයේ නවීන ක්‍රමයක් වන, රික්ත ඇසිරීමේදී,

1. ආහාර අඩංගු ඇසුරුම තුළ ඇති වාතය සම්පූර්ණයෙන්ම ඉවත් කෙරේ.
2. ආහාර ද්‍රව්‍ය සමඟ ඇසුරුමද ඉහළ උෂ්ණත්වයකට ලක් කෙරේ.
3. ආහාර අඩංගු ඇසුරුම තුළ ඇති වාතය ඉවත්කර ඇසුරුම තුළට නයිට්‍රජන් වායුව පුරවනු ලැබේ.
4. ආහාර අඩංගු ඇසුරුම තුළ ඇති වාතය ඉවත් කෙරෙන නිසා ආහාර හැකිලීමට ලක් වී, නැවුම්බව අඩු වේ.

40. ආහාරයක ඉන්ද්‍රියගෝචරතාව ලෙස හැඳින්වෙන්නේ,

1. මිනිසාගේ සංවේදී ඉන්ද්‍රියයන් මගින් ලබා ගන්නා සංවේදන ආශ්‍රයෙන් ආහාරයට ඇතිවන හැඟීම් ය.
2. වෙළඳ සමාගම්වල ප්‍රචාරණ කටයුතු හේතුවෙන් ආහාරයට ඇතිවන ඉල්ලුම ය.
3. පාරිභෝගිකයාගේ ආර්ථික තත්ත්වය මත ආහාරයට ඇතිවන ඉල්ලුම ය.
4. ආහාරවල ඉල්ලුම ප්‍රවර්ධනය සඳහා නවීන තාක්ෂණික ක්‍රම යොදා ගැනීම ය.

(හත්වෙනි පිටුව බලන්න)

අ.පොස. (සා.පෙළ) විභාගය - උපකාරක තක්සේරුව - 2026
අධ්‍යාපන අමාත්‍යාංශය - කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව
කෘෂි හා ආහාර තාක්ෂණය II

පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

1. කෘෂි හා ආහාර තාක්ෂණය හදාරන සිසුන් කණ්ඩායමක් ක්ෂේත්‍ර චාරිකාවක් සඳහා ශ්‍රී ලංකාවේ පොල් ත්‍රිකෝණය ආශ්‍රිත ගොවිපොළක් නිරීක්ෂණය සඳහා යන ලදී.

(i) (a) පොල් ත්‍රිකෝණයට අයත්වන ප්‍රදේශ තුන නම් කරන්න.
(b) දේශගුණික කලාපයක් වන අතරමැදි කලාපයේ වාර්ෂික වර්ෂාපතනය කොපමණද ?

(ii) පොල් වගාව අතර ඇති බිම් ඉඩෙහි වෙනත් බෝග ලෙස අන්නාසි, කෙසෙල් හා ඉඟුරු වගා කර තිබුණි.
(a) මෙහිදී අනුගමනය කර ඇති වගා රටාව නම් කරන්න.
(b) අන්නාසි, කෙසෙල් හා ඉඟුරු යන බෝග සඳහා සුදුසු සංස්ථාපන ක්‍රමය බැගින් සඳහන් කරන්න.

(iii) පහත සඳහන් බෝග අයත්වන ශාක කුල වෙන වෙනම ලියා දක්වන්න.
(a) පොල්
(b) ඉඟුරු

(iv) (a) ඉඟුරු වගාව සඳහා ප්‍රාථමික බිම් සැකසීමට යොදා ගත හැකි, යන්ත්‍ර බලයෙන් ක්‍රියා කරන උපකරණයක් නම් කරන්න.
(b) අන්නාසි වගාවේ රෝපණ ද්‍රව්‍ය ලෙස බහුලව භාවිත කරන වර්ධක ප්‍රවාරණ ව්‍යූහය කුමක්ද?

(v) මෙම ගොවිපොළේ බෝග වගාවට අමතරව සත්ත්ව පාලන කටයුතු ද සිදු කෙරේ.
(a) එම ගොවිපොළේ ඇති කළ හැකි ඉන්දීය කිරි ගව වරිග දෙකක් නම් කරන්න.
(b) බිත්තර සඳහා සන ආස්තරණ ක්‍රමයට කිකිළියන් ඇති කිරීමේදී එක් වැඩුණු සතෙකුට අවශ්‍ය ඉඩ ප්‍රමාණය කොපමණද?

(vi) (a) මෙම ගොවිපොළේ සත්ත්ව අපද්‍රව්‍ය යොදා නිෂ්පාදනය කළ හැකි කාබනික පොහොර වර්ග දෙකක් සඳහන් කරන්න.
(b) මෙම ගොවිපොළේ පොල් වගාව සඳහා රසායනික පොහොර භාවිතයෙන් ලැබෙන විශේෂ වාසි දෙකක් සඳහන් කරන්න.

(vii) මෙම වගා භූමියට පහසුවෙන් යොදා ගත හැකි ජල සංරක්ෂණ ක්‍රම දෙකක් ලියන්න.

(viii) මෙම භූමියේ පාංශු වයනය පරීක්ෂා කිරීමට රෝල් ක්‍රමය භාවිත කරන ලදී. එහිදී තෙත් කළ පස් රෝල කීප ස්ථානයකින් කැඩුණි.
(a) ඉහත නිරීක්ෂණයට අනුව එම පසේ වයනය කුමක්ද?
(b) එවැනි වයනයක් ඇති පසක වගා කළ හැකි ෆැබේසියේ කුලයේ තෙල් බෝගයක් නම් කරන්න.

(ix) මෙම ගොවිපොළේ වගා කළ කෙසෙල් අස්වැන්න නෙළීමේදී සලකා බලන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(x) (a) වී ශාක පත්‍ර වලින් යුෂ උරා බොන කෘමියෙක් නම් කරන්න.
(b) වී ශාක කඳට හානි කරන කෘමියෙක් නම් කරන්න.

(අටවෙනි පිටුව බලන්න)

2. බෝග වගාවේදී ප්‍රධාන වගා මාධ්‍යය වනුයේ පස ය. බෝගයකට උචිත ලෙස මනාව පාංශු පරිසරය සකසා ගත යුතු ය.

(i) (a) පාංශු බාදනය යන්න පැහැදිලි කරන්න.
(b) පාංශු සංරක්ෂණය සඳහා යොදා ගත හැකි යාන්ත්‍රික ක්‍රමයක් හා ජීව විද්‍යාත්මක ක්‍රමයක් ලියා දක්වන්න.

(ii) ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට ප්‍රශස්ත දේශගුණික තත්ත්ව තිබිය යුතු ය.
(a) බෝග වර්ධනය කෙරෙහි පරිසර උෂ්ණත්වයේ හිතකර බලපෑම් දෙකක් ලියන්න.
(b) ප්‍රභා අවධි සංවේදීතාව යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(iii) බෝග වගාවේදී ශාක පෝෂක කළමනාකරණය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
(a) පොහොර භාවිත කාර්යක්ෂමතාව යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?
(b) බෝග වගාවේ දී පොහොර භාවිත කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සැලකිය යුතු කරුණු තුනක් ලියන්න.

3. කෘෂිකර්මයේ දී, බිම් සැකසීම කළමනාකරණයෙන් ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව, වැඩි ඵලදාවක් ලබා ගත හැකි වේ.

(i) පහත දක්වා ඇති රූපය ඇසුරෙන් පිළිතුරු සපයන්න.



(a) ඉහත උපකරණය හඳුනාගෙන නම් කරන්න.
(b) ඉහත උපකරණය භාවිත කරන කාර්යය ලියන්න.

(ii) (a) බිම් සැකසීම මගින් දියුණු කර ගත හැකි පාංශු භෞතික ගුණාංග දෙකක් සඳහන් කරන්න.

(b) තවානක් සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගැනීමේදී සැලකිය යුතු කරුණු තුනක් සඳහන් කරන්න.

(iii) (a) බෝග වගා භූමියකට ජල සම්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.
(b) ජලවහනය යනු කුමක්ද?
(c) හෙරින්බෝන් ජලවහන කාණු රටාව රූපසටහනක් මඟින් ඇඳ දක්වන්න.

(නවවෙනි පිටුව බලන්න)

4. බෝග වගාවේදී, පළිබෝධ කළමනාකරණය පිළිබඳව නිසි අවධානය යොමු කිරීමෙන් අපේක්ෂිත අස්වනු ඉලක්ක සපුරා ගැනීමට හැකිවේ.

(i) වල් පැළෑටි වර්ගීකරණය පිළිබඳ ලබා දී ඇති උදාහරණයට අනුව පහත වගුව ඔබේ පිළිතුරු පත්‍රයට පිටපත් කරගෙන සම්පූර්ණ කරන්න.

වල් පැළෑටියේ නම	ජීවිත කාලය		රූපාකාරය		
	වාර්ෂික	බහු වාර්ෂික	තෘණ	පන්	පළල් පත්‍ර
උදා: කුප්පමේනිය	√				√
1. හුලංතලා					
2. ඇටවරා					
3. තුනැස්ස					
4. කලාඳුරු					
5. ගඳපාන					

(ii) (a) රෝග ත්‍රිකෝණය ඇඳ නම් කරන්න.
(b) සොලනේසියේ කුලයේ බීජ තවාන්වලට බහුලව වැළඳෙන දිලීර රෝගයක් ලියන්න.
(c) එම රෝගය පාලනය කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග 2 ක් නම් කරන්න.

(iii) (a) රසායනික වල් නාශක ක්‍රියාකාරිත්වය අනුව වර්ග කර දක්වන්න.
(b) කෘමීන් විකර්ෂණය සඳහා ගොවිපොළක් තුළ සිටුවිය හැකි ශාක වර්ග තුනක් ලියන්න.

5. උඩරට එළවළු වගා කරන ගොවි මහතෙක් හොඳින් සූර්යාලෝකය ලැබෙන දිනක උදෑසන තම වගා බිමේ ඇති සලාද, කැරට් හා ගෝවා අස්වැන්න නෙළා ප්‍රවාහනය කරන තෙක් ක්ෂේත්‍රයේම ගොඩ ගසා තැබුවේ ය.

(i) (a) වැඩි වේලාවක් ක්ෂේත්‍රයේ ගොඩ ගැසීම නිසා අස්වැන්නට සිදුවන හානි දෙකක් ලියන්න.
(b) එම හානි වළක්වා ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න.

(ii) (a) පහත සඳහන් එක් එක් ආහාර වර්ගය පරිරක්ෂණය කිරීමට යොදා ගත් පරිරක්ෂණ ක්‍රමය බැගින් ලියා දක්වන්න.

1. යෝගට් -
2. අටුකොස් -
3. පලතුරු ජෑම් -
4. කිරිපිටි -

(b) නෙළාගත් එළවළු හා පලතුරු අස්වැන්න ප්‍රවාහනය කිරීමේ දී සැලකිය යුතු කරුණු දෙකක් ලියන්න.

(iii) (a) වෙළඳපොළෙහි ආහාර බාල කිරීම සිදු කරන අවස්ථා සඳහා උදාහරණ තුනක් සඳහන් කරන්න.
(b) ආහාරයක ඉන්ද්‍රියගෝචරතාව ඇගයීමේ අරමුණු තුනක් සඳහන් කරන්න.

6. බෝග වගාවේදී රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ශාක ප්‍රවාරණ ක්‍රම භාවිත කෙරේ.

(i) (a) බීජ වල ප්‍රරෝහණ ප්‍රතිශතය සෙවීමේ ක්‍රම දෙකක් ලියන්න.
(b) ශාක බද්ධ කිරීමේ ප්‍රධාන ක්‍රම දෙක නම් කරන්න.
(c) ඉහත එක් ක්‍රමයක් මගින් අඹ පැළයක් බද්ධ කරගන්නා ආකාරය නම් කරන ලද රූප සටහනක් ඇසුරෙන් දක්වන්න.

(ii) (a) භූමි අතු බැඳීමේ ආකාර නම් කරන්න.
(b) ඉහත නම් කළ ආකාර සඳහා උදාහරණය බැගින් සඳහන් කරන්න.

(iii) පාලිත තත්ත්ව යටතේ වගා ගෘහ තුළ බෝග වගා කිරීමේ වාසි දෙකක් ලියා දක්වන්න.

(දසවෙනි පිටුව බලන්න)

7. ශ්‍රී ලංකාවේ කුකුළන් ඇති කිරීම සඳහා බහුල වශයෙන් යොදා ගැනෙනුයේ සන ආස්තරණ ක්‍රමයයි.

(i) (a) සන ආස්තරණ ක්‍රමයට කුකුළන් ඇති කිරීමේ වාසි තුනක් සඳහන් කරන්න.

(b) බ්‍රොයිලර් නිෂ්පාදනයේ වාසි තුනක් සඳහන් කරන්න.

(c) බ්‍රොයිලර් සතුන්ගේ වර්ධන අවධිය ලෙස ගැනෙන කාලසීමාව කොපමණද?

(ii) (a) සත්ත්ව ආහාර සලාක පිළියෙල කිරීමේදී, ප්‍රෝටීන ලබා ගැනීමට යොදා ගත හැකි සත්ව ආහාර වර්ග දෙකක් සඳහන් කරන්න.

(b) බිත්තර දමන කිකිළියන්ගේ ආහාර සලාකවලට සිප්පි කටු එකතු කිරීමේ ප්‍රධාන අරමුණ කුමක්ද?

(iii) (a) ගව දෙනුන් කෘත්‍රිම සිංචනය කිරීමේ වාසි දෙකක් සඳහන් කරන්න.

(b) ගොවිපොළ සතුන්ට වැළඳෙන රෝග වළක්වා ගැනීමට ගත හැකි පූර්ව ක්‍රියාමාර්ග හතරක් නම් කරන්න.

අ.පො.ස. (සා.පෙළ) විභාගය - උපකාරක තක්සේරුව - 2026

අධ්‍යාපන අමාත්‍යාංශය - කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව

කෘෂි හා ආහාර තාක්ෂණය | කොටස - පිළිතුරු

ප්‍රශ්න අංකය	පිළිතුර	නිපුණතා මට්ටම	ශ්‍රේණිය
01	2	1.1	10
02	1	2.1	10
03	1	2.3	10
04	2	3.2	10
05	4	3.3	10
06	1	3.3	10
07	3	3.5	10
08	4	4.1	10
09	3	5.3	10
10	3	6.2	10
11	2	7.2	10
12	2	7.3	10
13	1	8.2	10
14	4	8.2	10
15	2	9.1	10
16	4	9.2	10
17	2	9.3	10
18	4	9.3	10
19	3	10.6	10
20	4	10.7	10
21	3	1.1	11
22	2	1.2	11
23	4	1.2	11
24	1	1.2	11
25	2	2.2	11
26	2	2.1	11
27	4	3.1	11
28	3	4.1	11
29	2	5.1	11
30	1	6.2	11
31	2	7.2	11
32	4	7.2	11
33	1	7.2	11
34	3	8.2	11
35	1	8.4	11
36	3	8.5	11
37	4	8.5	11
38	3	8.5	11
39	1	9.1	11
40	1	10.2	11

Past Papers Wiki

අ.පොෂ.ස. (සා.පෙළ) විභාගය - උපකාරක තක්සේරුව - 2026

අධ්‍යාපන අමාත්‍යාංශය - කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව

කෘෂි හා ආහාර තාක්ෂණය II

පිළිතුරු

1. (i) (a) කුරුණෑගල, කොළඹ, හලාවත (ලකුණු 1/2 ×3=1 1/2)

(b) 1750 - 2500 mm (ලකුණු 1/2×1=1/2)

(ii) (a) අතුරුබෝග වගාව (ලකුණු1/2×1=1/2)

(b) අන්නාසි - දෙපේළි
කෙසෙල් - ත්‍රිකෝණ, පහේ බෙදුම් ක්‍රමය
ඉඟුරු - තනි පේළි (ලකුණු 1/2 ×3=1 1/2)

(iii) (a) පොල් - ඇරිකේසියේ (Arecaceae)

(b) ඉඟුරු - සින්ජිබරේසියේ (Zingiberaceae) (ලකුණු 1×2=2)

(iv) (a) තැටි නඟුල, හැඩ ලෑලි නඟුල (ලකුණු 1 ×1=1)

(b) මොරෙයියන් (ලකුණු 1×1=1)

(v) (a) සහිවාල්, සින්දි (ලකුණු 1×1=1)

(b) වර්ග අඩි 2 1/2 (ලකුණු 1×1=1)

(vi) (a) අමු ගොම පොහොර, කොම්පෝස්ට්, කාබනික දියර පොහොර, සත්ව පොහොර, කුකුල් පොහොර (ලකුණු 1/2×2=1)

(b) ඌනතාවයට අනුව ඊට අදාළ රසායනික පොහොර යෙදිය හැකිය.
ක්ෂේත්‍රයට යෙදීම පහසුයි.
ගබඩා කර තැබීමට අඩු ඉඩක් අවශ්‍යයි.
ශාක වලට අවශෝෂණය පහසුයි.
ප්‍රවාහනය පහසුයි. (ලකුණු 1/2×2=1)

(vii) කාබනික ද්‍රව්‍ය පසට යෙදීම/ වසුන් යෙදීම/ වල් පැළ පාලනය/පස මතුපිටින් ජලය ගලා යාමට බාධා කිරීම (ලකුණු 1×2=2)

(viii) (a) වැලි ලෝම පස (ලකුණු 1×1=1)

(b) රට කජු (ලකුණු1×1=1)

(ix) බර, ගෙඩිවල පිරුණු ස්වභාවය, කෙසෙල් ගෙඩිවල වර්ණය වෙනස් වීම (ලකුණු1×2=2)

(x) (a) පැළ මැක්කා, කීඩැවා (ලකුණු1×1=1)

(b) පුරුක් පණුවා, ගොක් මැස්සා (ලකුණු1×1=1)

(මුළු ලකුණු 20)

(දෙවෙනි පිටුව බලන්න)

PAST PAPERS WIKI

2.

(i) (a) යම් ස්ථානයක පිහිටි පස් අංශු පාංශු දේහයෙන් වෙන් වී , පාංශු බාදන කාරක හේතුවෙන්, වෙනත් ස්ථානයකට ප්‍රවාහනය වී තැන්පත් වීමය.

(ලකුණු 1×1=1)

(b) යාන්ත්‍රික ක්‍රම : ගල් වැටි, පස් වැටි, කාණු යෙදීම , හෙල්මළු
ජීව විද්‍යාත්මක ක්‍රම: ආවරණ බෝග වගා කිරීම, සැවැන්දරා වැටි, දෙවැටි (SALT)

(ලකුණු 1×2=2)

(ii) (a) බීජ ප්‍රරෝහණයට, ප්‍රභාසංස්ලේෂණයට, දඬු කැබලි මුල් ඇද්දවීමට, අල බෝග වල ආකන්ද ඇති වීමට (ලකුණු 1×2=2)

(b) පුෂ්ප හටගැනීමේදී දිවා කාලයේ දිග කෙරෙහි ශාක දක්වන ප්‍රතිචාරය යි. (ලකුණු 1×1=1)

(iii) (a) පසට යොදන පොහොර බෝග විසින් ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව පොහොර භාවිත කාර්යක්ෂමතාව ලෙස හැඳින්වේ. (ලකුණු 1×1=1)

(b) පසේ අඩංගු පෝෂක ප්‍රමාණය , දේශගුණික තත්ත්වය, පසේ තෙතමන තත්වය, බෝගයට සුදුසු පොහොර යෙදීමේ ක්‍රම අනුගමනය කිරීම, වගාවේ අවස්ථාවට සුදුසු පොහොර වර්ග තෝරා ගැනීම.

(ලකුණු 1×3=3)

(මුළු ලකුණු 10)

(තුන්වෙනි පිටුව බලන්න)

3. (i) (a) රිජරය/ඇලිවැටි සකසනය (ලකුණු 1×1=1)
(b) ඇලි වැටි සැකසීම/වැටි හා කාණු සැකසීම (ද්විතීයික බිම් සැකසීම) (ලකුණු 1×1=1)

(ii) (a) පාංශු වායුභය, පාංශු වාතනය, ජලවහනය, ජලය රඳවා ගැනීමේ හැකියාව

(ලකුණු 1/2×2=1)


(b) අදාළ බෝග වලට පස, දේශගුණය ගැලපේද යන බව
සූර්ය රශ්මිය හොඳින් ලැබෙන ස්ථානයක් වීම
ප්‍රවාහන පහසුකම් සහිත ස්ථානයක් වීම
ජල පහසුකම් සහිත ස්ථානයක් වීම
අලෙවි පහසුකම් තිබීම
ජලවහනය හොඳින් සිදුවන ස්ථානයක් වීම
අධික සුළං නොමැති ස්ථානයක් වීම
රෝගී වගාවක් නොතිබුණු ස්ථානයක් වීම

(ලකුණු 1×3=3)

(iii) (a) වගා කර ඇති බෝග වර්ගය , පසේ වයනය (ස්වභාවය) , දේශගුණ තත්ත්වය (සුළඟ, සූර්යාලෝකය) ආර්ථික තත්ත්වය, පසේ බෑවුම , බෝගයේ වයස, බෝග සිටුවා ඇති පරතරය, බෝගයේ ජීව කාලය
(ලකුණු 1/2×2=1)

(b) බෝග වගා භූමිවල ඇති අතිරික්ත ජලය හෙවත් පසේ ක්ෂේත්‍ර ධාරිතාවෙන් ඔබ්බට ඇති ජලය ක්ෂේත්‍රයෙන් බැහැර කිරීම ජලවහනයයි. (ලකුණු 1)

(c)



(රූප සටහනට ලකුණු 1, නම් කිරීමට ලකුණු 1ක් ප්‍රදානය කරන්න.) (ලකුණු 2)

(මුළු ලකුණු 10)


4.

(i)

වල් පැළෑටියේ නම	ජීවිත කාලය		රූපාකාරය		
	වාර්ෂික	බහු වාර්ෂික	තෘණ	පන්	පළල් පත්‍ර
උදා: කුප්පමේනිය	√				√
1. හුලංතලා	√				√
2. ඇටවරා		√	√		
3. තුනැස්ස	√			√	
4. කලාඳුරු		√		√	
5. ගඳපාන		√			√

(ලකුණු 1/4x10=2 1/2)

(ii) (a)



(රූපයට ලකුණු 1 , නම් කිරීමට ලකුණු 1) (ලකුණු 2)

(b) දියමලංකෑම/ Damping off (ලකුණු 1x1= 1)

(c)

- තවාන් ජීවාණුහරණය
- බීජ ජීවාණුහරණය
- තවානට දිලීර නාශක යෙදීම/අළු යෙදීම/කර දහයියා යෙදීම

(ලකුණු 1x2=2)

(iii)

(a) ස්පර්ශ විෂ / සංස්ථානික විෂ(පරිසර්පන) (ලකුණු 1/2 x 2= 1)

(b) දහස්පෙතියා/කපුරු/ අටපෙතියා (ලකුණු 1/2 x 3=1 1/2)

(මුළු ලකුණු 10)

(පස්වෙනි පිටුව බලන්න)

5.

(i) (a) ක්ෂේත්‍ර තාපය වැඩි වීම නිසා, මැලවීම හා වියළීම, රෝග ව්‍යාප්ත වීම, කුණු වීම

(ලකුණු ½ x 2=1)

(b) ප්ලාස්ටික්, ලී පෙට්ටි වල ඇසිරීම
සෙවණ සහිත ස්ථානයක තැබීම
අස්වනු නෙළීමට දිනයේ සුදුසු වේලාවක් තෝරා ගැනීම
අස්වනු එකිනෙක මත ගොඩගැසීමෙන් වැළකීම

(ලකුණු 1 x 2=2)

(ii) (a) 1. යෝගට් - ආම්ලික පැසවීම
2. අටු කොස් - වියළීම
3. පලතුරු ජෑම් - සාන්ද්‍රීකරණය
4. කිරිපිටි - විසිරි වියළීම (ලකුණු ½ x 4=2)

(b) වාහනයේ යෝග්‍යතාව (ආවෘත වීම, පිරිසිදු බව)
මාර්ග වල තත්ත්වය
අදාළ ස්ථානයට කෙටි කාලයක් තුළ ළඟාවීමට ඇති හැකියාව
රියදුරාගේ පරීක්ෂාකාරී බව
අස්වනු මත පුද්ගලයන් නැගීම/ වාඩිවීම සිදු නොකිරීම
ප්‍රමිතියට අනුව අසුරා ආරක්ෂාකාරීව ප්‍රවාහනය කිරීම

(ලකුණු 1×2=2)

(iii) (a) කුරක්කන් පිටි වලට හාල් පිටි මිශ්‍ර කිරීම
කහ කුඩු වලට, ඩයි වර්ග (වර්ණක) මිශ්‍ර කිරීම
තේ කුඩු වලට වර්ණක මිශ්‍ර කිරීම
එළකිරි වලට ජලය මිශ්‍ර කිරීම
කිරිපිටි වලට වෙනත් පිටි වර්ග මිශ්‍ර කිරීම (ලකුණු 1/2×3=1 1/2)

(b) ආහාරයේ ගුණාංග හා ස්වභාවය හඳුනා ගැනීම
ආහාර වර්ග කිහිපයක ඉන්ද්‍රියගෝචර ලක්ෂණ අනුව ගුණාංග සැසඳීම
ආහාර තත්ත්ව පාලනයේදී තිබිය යුතු ගුණාංග තිබේද යන්න පරීක්ෂාව
ආහාරයක ජීව කාලය තීරණය කිරීම
නව ආහාර හඳුන්වා දීමේදී ගුණාත්මය පිළිබඳ පාරිභෝගික අදහස් දැන ගැනීමට

(ලකුණු 1/2×3=1 1/2)

(මුළු ලකුණු 10)


PAST PAPERS WIKI


Past Papers Wiki

6. (i) (a) රැග්ඩෝල් ක්‍රමය, පෙට්‍රිදීසි ක්‍රමය (ලකුණු 1 /2×2=1)

(b) අංකුර බද්ධය, රිකිලි බද්ධය (ලකුණු 1 /2×2=1)

(c)





ඉහත එක් බද්ධ ක්‍රමයක රූප සටහන ඇඳීම සඳහා ලකුණු 2, නම් කිරීම/ විස්තර කිරීමට ලකුණු 2

(ලකුණු 4)

(ii)

(a)	(b)
සරල අතු බැඳීම	ලෙමන්, සමන් පිච්ච
සංයුක්ත අතු බැඳීම	මිදි, බුලත්, සමන් පිච්ච,පැෂන්, ගම්මිරිස්
(ලකුණු 1 /2×2=1)	(ලකුණු 1 /2×2=1)

(ලකුණු 2)

(iii) රෝග, පළිබෝධ හානි වලින් බෝග ආරක්ෂා වීම
අස්වැන්න ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව උසස් වීම
අවාරයේ අස්වනු නෙළා ගත හැකි වීම
සාමාන්‍ය පරිසරයේ වගා කිරීමට අපහසු බෝග වගා කිරීමට හැකි වීම.
උදා: ස්ට්‍රෝබෙරි, බෙල් පෙපර්
උසස් ගුණාත්මයෙන් යුත් අස්වැන්න හේතුවෙන් වැඩි ලාබයක් ගැනීමට හැකි වීම.

(ලකුණු 1×2=2)

(මුළු ලකුණු 10)

PAST PAPERS WIKI

7. (i) (a) ඒකීය ඉඩ ප්‍රමාණයක වැඩි සතුන් සංඛ්‍යාවක් ඇතිකළ හැකිය.
බිත්තර පිරිසිදුව හා සුරක්ෂිතව ලබා ගත හැකිය.
පාලනය පහසු ය.
ඉවත් කෙරෙන ආස්තරණය පොහොර ලෙස භාවිත කළ හැකිය.
පරපෝෂිත රෝග බෝවීම අඩුය.
ආස්තරණයේ විටමින් B සංස්ලේෂණය වීම නිසා සතුන්ට විටමින් B ඌනතා ඇති නොවේ.
(ලකුණු½ x 3=1 1/2)

(b) කෙටි කාලයකින් ආදායම් ලැබීම
පාලනය පහසු වීම
ස්වයං රැකියාවක් ලෙස පවත්වාගත හැකි වීම
හොඳ ආදායමක් ලැබීම
වෙළඳපොළේ පවතින අධික ඉල්ලුම
ආහාර පරිවර්තන කාර්යක්ෂමතාව ඉතා ඉහළවීම
(ලකුණු½ x 3=1 1/2)

(c) දින 21 – 42 දක්වා කාල සීමාව (ලකුණු 1)

(ii) (a) මාළු කුඩු, මස් කුඩු, කිරි පිටි, පොල් පුන්නක්කු, තල පුන්නක්කු, සෝයා අන්නය
(ලකුණු ½ x 2 = 1)

(b) කැල්සියම් ඛනිජය ලබා ගැනීම සඳහා
බිත්තර කටුව ඝනකම වීමට (ලකුණු 1)

(iii) (a) උසස් වර්ගයේ සතෙකුගේ ශුක්‍රාණු ගබඩා කර වසර ගණනාවක් භාවිතයට ගත හැකි වීම.
උසස් වර්ගයේ සතෙකුගේ ශුක්‍රාණු සතුන් දෙමුහුම් කිරීමට භාවිතා කර උසස් දෙමුහුම් සතුන් බිහි කර ගැනීමේ හැකියාව.
එක් උසස් පිරිමි සතෙකුගේ ශුක්‍රාණු ගැහැණු සතුන් රාශියක් සිංචනය කිරීම සඳහා යොදා ගත හැකි වීම.
කුඩා ගොවිපොළ හිමියන්ට පුං ගවයන් ඇති කිරීමට අවශ්‍ය නොවීම.
එක් අවස්ථාවක දී ලබා ගන්නා ශුක්‍රාණු වාර ගණනාවක් භාවිත කළ හැකි වීම.
(ලකුණු 1 x 2 = 2)

(b) නිසි කලට එන්නත් කිරීම
සත්ත්ව නිවාස පිරිසිදුව තබාගැනීම
සත්ත්ව නිවාස තුළට බාහිර පුද්ගලයන් ඇතුළු වීම වැළැක්වීම
රෝගී සතුන් වෙන් කර තැබීම
සමබල ආහාර සලාකයක් ලබා දීම
වයස අනුව සතුන් වෙන් කර තැබීම (ලකුණු 1 x 2 = 2)

(මුළු ලකුණු 10)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library